# දුස්සීලයෝ දුස්සීලයන් සමඟ ම සිල්වත්තු සිල්වතුන් සමඟ ම මෝඩයෝ මෝඩයන් සමඟ ම නුවණැත්තෝ නුවණැත්තන් සමඟ ම ගැළපෙති එකතු වෙති

## දුස්සීල සූත්‍රය ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, සංයුක්ත නිකාය 2 - පිටු අංක 258 - 259)

ධාතු වශයෙන් ම සත්වයෝ ගැළපෙති, එකතු වෙති.

- ශ්‍රද්ධාව නැත්තෝ ශ්‍රද්ධාව නැත්තවුන් සමඟ ම ගැළපෙති, එකතු වෙති.
- පවට ලජ්ජා නැත්තෝ පවට ලජ්ජා නැත්තවුන් සමඟ ම ගැළපෙති, එකතු වෙති.
- පවට බිය නැත්තෝ පවට බිය නැත්තවුන් සමඟ ම ගැළපෙති, එකතු වෙති.
- දුස්සීලයෝ දුස්සීලයන් සමඟ ම ගැළපෙති, එකතු වෙති.
- අනුවණයෝ අනුවණයන් සමඟ ම ගැළපෙති, එකතු වෙති.

එසේ ම,

- ශ්‍රද්ධාවන්තයෝ ශ්‍රද්ධාවන්තයන් සමඟ ම ගැළපෙති, එකතු වෙති.
- පවට ලජ්ජා ඇත්තෝ පවට ලජ්ජා ඇත්තවුන් සමඟ ම ගැළපෙති, එකතු වෙති.
- පවට බිය ඇත්තෝ පවට බිය ඇත්තවුන් සමඟ ම ගැළපෙති, එකතු වෙති.
- සිල්වත්තු සිල්වතුන් සමඟ ම ගැළපෙති, එකතු වෙති.
- නුවණැත්තෝ නුවණැත්තන් සමඟ ම ගැළපෙති, එකතු වෙති.